# STRATEGIC PLAN

# 2020-2025

Lalith Athulathmudali Mahapola Higher Education Scholarship Trust Fund

# උපායමාර්ගික සැලැස්ම

# 2020 - 2025

# පටුන

කෙටි යෙදුම්

ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන විශ්වවිද්‍යාලය/විද්‍යායතන

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයපථය යටතේ පවතින ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන කාර්මික විද්‍යාල

මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ සංවිධාන ව්‍යුහය

උපායමාර්ගික සැලසුමේ පරිශීලකයන් සඳහා මඟපෙන්වීම

දැක්ම

මෙහෙවර

අපගේ වටිනාකම්

ඉලක්ක

1 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

2 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

3 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

4 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

5 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

6 වන ඉලක්කය, ඒ හා සම්බන්ධිත අරමුණු සමඟ ප්‍රධාන කාර්යසාධන දර්ශක

උපායමාර්ගික සැලැස්ම තුළ ප්‍රධාන කාර්යසාධන දර්ශකවල වැදගත්කම සහ කාර්යභාරය

උපායමාර්ග සඳහා සක්‍රියකාරක

අපේක්ෂිත මුදල් ප්‍රවාහ විශ්ලේෂණය

සමාප්තිය

මහපොල ශිෂ්‍යත්ව ලබාදෙන විශ්වවිද්‍යාල

1. කොළඹ විශ්ව විද්‍යාලය
2. කොළඹ විශ්ව විද්‍යාලය - පරිගණක විද්‍යායතනය
3. කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රීපාලි මණ්ඩපය
4. කොළඹ විශ්ව විද්‍යාලය - දේශීය වෛද්‍ය ආයතනය
5. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
6. කැළණිය විශ්වවිද්‍යාලය
7. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය
8. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
9. මොරටුව විශ්වවිද්‍යාලය
10. යාපනය විශ්වවිද්‍යාලය
11. යාපනය විශ්වවිද්‍යාලය - රාමනාදන් කළා ඇකඩමි
12. යාපනය විශ්වවිද්‍යාලය - වව්නියා මණ්ඩපය
13. රුහුණු විශ්වවිද්‍යාලය
14. නැගෙනහිර විශ්වවිද්‍යාලය
15. නැගෙනහිර විශ්වවිද්‍යාලය - ත්‍රිකුණාමළය මණ්ඩපය
16. නැගෙනහිර විශ්වවිද්‍යාලය - ස්වාමි විපුලානන්ද කළා මණ්ඩපය
17. අග්නිදිග විශ්වවිද්‍යාලය
18. රජරට විශ්වවිද්‍යාලය
19. සබරගමුව විශ්වවිද්‍යාලය
20. වයඹ විශ්වවිද්‍යාලය
21. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
22. දෘශ්‍ය කළා විශ්වවිද්‍යාලය

මහපොල ශිෂ්‍යත්ව ලබාදෙන උසස් අධ්‍යාපන ආයතන


1. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
2. බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
3. ශ්‍රී ලංකා නීති විද්‍යාලය
4. ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව
5. ජාතික සමාජ සංවර්ධන ආයතනය
6. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

1. කාර්මික විද්‍යාලය - අනුරාධපුර
2. කාර්මික විද්‍යාලය - අම්පාර
3. කාර්මික විද්‍යාලය - මඩකළපුව
4. කාර්මික විද්‍යාලය - බදුල්ල
5. කාර්මික විද්‍යාලය - දෙහිවල
6. කාර්මික විද්‍යාලය - යාපනය
7. කාර්මික විද්‍යාලය - නුවර
8. කාර්මික විද්‍යාලය - කෑගල්ල
9. කාර්මික විද්‍යාලය - කුරුණෑගල
10. කාර්මික විද්‍යාලය - ලබුදූව
11. කාර්මික විද්‍යාලය - මට්ටක්කුළිය
12. කාර්මික විද්‍යාලය - නයිවල
13. කාර්මික විද්‍යාලය - සමන්තුරේ
14. කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමළය
15. කාර්මික විද්‍යාලය - තංගල්ල
16. කාර්මික විද්‍යාලය - රත්නපුර
17. කාර්මික විද්‍යාලය - වව්නියාව
18. කාර්මික විද්‍යාලය - නාවලපිටිය
19. කාර්මික විද්‍යාලය - මන්නාරම

# සංවිධාන ව්‍යුහය

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල




කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - |
| ද්විතීය මට්ටම | 06 | 02 | 04 |
| තෘතීය මට්ටම | 19 | 08 | 11 |
| ප්‍රමුඛ | 05 | 02 | 03 |

# පරිශීලකයන් සඳහා උපායමාර්ගික සැලැස්ම හා සම්බන්ධ මාර්ගෝපදේශ

## උපායමාර්ගික සැලැස්මේ පරිශීලකයන් සඳහා මාර්ගෝපදේශ

මහපොළ භාර අරමුදලේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ දී භාර අරමුදලේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශන මූලික පදනම ලෙස සලකන ලද අතර මෙම සැලැස්මේ අන්තර්ගත සියලුම කරුණු එකී දැක්ම සහ මෙහෙවර මත පෙළගැසී තිබේ. මහපොළ භාර අරමුදලෙහි අභිලාෂයන් දැක්ම ප්‍රකාශනය මඟින් පිළිඹිබු වන අතර, මෙහෙවර ප්‍රකාශනය මඟින් සංක්ෂිප්ත වශයෙන් නමුදු භාර අරමුදල පවතින්නේ කුමක් අරභයාද යන්න සහ එහි මෙහෙයුම් මඟින් ළඟා කර ගැනීමට අපේක්ෂා කරනුයේ කුමක්ද යන්න පරිපූර්ණ ලෙස ප්‍රකාශ කෙරේ.

හරයාත්මක වටිනාකම් හා උපායමාර්ග සඳහා සක්‍රියකාරක පිළිබඳව දෙවෙනි කොටසෙහි අන්තර්ගත වන අතර, එකී කොටස් උපායමාර්ග සඳහා උපකාරී සංරචක ලෙස සලකනු ලැබේ. එමඟින් අන්තර්ගතය සඳහා අඩිතාලමක් සපයන අතර සැලසුම්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා මඟපෙන්වීම ලබා දේ. මහපොළ භාර අරමුදලේ ආයතනික සංස්කෘතිය සහ එහි ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආයතනය කටයුතු කරනුයේ කෙසේ ද යන්න හරයාත්මක වටිනාකම් ඔස්සේ විස්තර කෙරෙන අතර උපායමාර්ග සඳහා සක්‍රියකාරක මඟින් උපායමාර්ග ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කර නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රබල කාර්යක්ෂම බැඳීමක් ඇති කරනු ලැබේ.

මෙම උපායමාර්ගික සැලැස්මේ තෙවන කොටස ලෙස අන්තර්ගත වනුයේ උපායමාර්ග කොටස වේ. මෙහි ඉලක්ක, අරමුණු හා ප්‍රධාන කාර්ය සාධක දර්ශක අන්තර්ගත වේ. ඉලක්ක (goals) හා අරමුණු (objectives) යන යෙදුම් ද්විත්වය සම්බන්ධයෙන් ව්‍යාකූලතාවයක් පවතිනුයේ බොහෝ දෙනා විසින් මෙම යෙදුම් ද්විත්වය බොහෝවිට එකිනෙක මාරු කරමින් භාවිතා කිරීම නිසාවෙනි. එබැවින් සැලසුම් ක්‍රියාවලියේ නිරත සියලු දෙනා විසින් එකඟවන ආකාරයට පොදු සම්මුතිය වනුයේ, මෙම වචන සංයෝජන භාවිතා කළ හැකි අර්ථ දැක්වීමේ අනුපිළිවෙලකි. මෙහි දී මහපොළ භාර අරමුදල විසින් ළඟාකර ගැනීමට ප්‍රයත්න දරන උපායමාර්ගික ඉලක්ක හෝ දිගු කාලීන යහසාධන තත්ත්ව, ඉලක්ක (goals) ලෙස සැලකේ. උපායමාර්ගික ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වන සවිස්තරාත්මක මධ්‍යකාලීන සිට දීර්ඝකාලීන කාල පරාසයකට දිවෙන අභිමතාර්ථ, ක්‍රියාමාර්ග හෝ සැලසුම් කළ වැඩසටහන් මඟින් අරමුණු (objectives) නියෝජනය වේ.

අරමුණුවලට සම්බන්ධිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක මඟින් සුවිශේෂී ඉලක්ක ඔස්සේ මහපොළ භාර අරමුදලේ දැක්ම කරා ළඟා වීමේ ප්‍රගතිය හා සාර්ථකත්වය ඇගයීම සඳහා වන යාන්ත්‍රණය සැපයේ.

මීලඟ කොටස් මඟින් දැක්ම, මෙහෙවර, වටිනාකම්, ඉලක්ක, අරමුණු හා 2020-2025 උපායමාර්ගික සැලැස්ම යන කරුණු ආවරණය කරනු ලැබේ. එහි අන්තර්ගත කොටස් ප්‍රකාශයට පත් කිරීම සඳහා භාර අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් අතර මෙම ලේඛනය පොදු ලේඛනයක් වශයෙන් භාවිතා කරනු ලැබේ. පහත සඳහන් කර ඇති හේතු මත මෙහි අන්තර්ගත නොකළ ද, මහපොළ භාර අරමුදලේ උපායමාර්ගික

ක්‍රියාත්මක ක්‍රියාවලිය තුළ වැදගත් කාර්යභාරයක් ක්‍රියාත්මක සැලැස්ම මඟින් ඉටු කරනු ලැබේ.

## ක්‍රියාත්මක සැලැස්ම

ප්‍රකාශයට පත් කරනු ලබන ඉලක්ක, අරමුණු හා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම ක්‍රියාත්මක සැලැස්මෙහි කාර්යය වේ. උපායමාර්ගික සැලැස්ම ඔස්සේ මහපොළ භාර අරමුදලේ එක් එක් අංශ සඳහා ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරි සැලසුමෙහි මඟ පෙන්වීම වනුයේ උපාය මාර්ගික ඉලක්ක හා අරමුණු වේ. ක්‍රියාත්මක සැලැස්මෙහි දිගු කාලීන වශයෙන් සැලකෙන අවධානිත කරුණු වනුයේ පවතින සම්පත් සැලකිල්ලට යොමු කර අදාළ කාර්යය ඉටු කර ගැනීම වේ.

ක්‍රියාකාරි සැලැස්ම අන්තර්ගත උපායමාර්ගික ලේඛනයේ මෙම කොටස, පොදු භාවිතය සඳහා යොදා නොගැනෙන මහපොළ භාර අරමුදලේ ඉතා වැදගත් අභ්‍යන්තර ලේඛනයක් වශයෙන් සැලකේ. මෙයට ප්‍රධානතම හේතුව වනුයේ ක්‍රියාකාරී සැලසුම් යනු කෙටිකාලීන සැලසුම් වීමයි (වසරකට අඩු කාලසීමාවක් සඳහා මාසික වශයෙනි)

මෙය වාර්ෂික වශයෙන් වාර්තා කරන අතර කාර්ය පරිසරයේ පවතින ගතික ස්වභාවයන්ට ප්‍රතිචාර දැක්වීමට හා අනුගත වීම සඳහා නිරන්තර වෙනස් කිරීම් හෝ සංශෝධනවලට යටත් වේ.

උපායමාර්ගික සැලසුම් මෙහෙයුම් කාර්යන් බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලියේ සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා මෙම ක්‍රියාත්මක සැලසුම ඍජු හා පැහැදිලි වශයෙන් එක් එක් අංශවලට වෙන්කළ ලේඛනයක් වශයෙන් සම්පාදනය කළ යුතු වේ. එක් එක් විශේෂිත කාර්යය  නිමකළ යුතු දිනයක් නියම කළ යුතු අතර ඒ සඳහා වගකිව යුතු තැනැත්තෙකු ද පත් කළ යුතු වේ. යම්කිසි නියමිත කාර්යයන් සඳහා එක් අංශයක් තුළ බොහෝ දෙනෙකු සම්බන්ධ වුව ද,  එවැනි එක් එක් කාර්යය නිම කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා බලය පැවරූ පුද්ගලයෙකු පත් කිරීම ඥානාන්විත පියවරක් වනු ඇත.

## ක්‍රමෝපායික සැලසුම සැකෙවින්

| | ඉලක්ක | අරමුණු | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ක්‍රියාත්මක සැලසුම |
|---|---|---|---|---|
| අපගේ දැක්ම සහ මෙහෙවර | ඉලක්කය 1 | අරමුණු 01 – 05 | 01වන ඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම |
| | ඉලක්කය 2 | අරමුණු 01 – 03 | 02වනඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| | ඉලක්කය 3 | අරමුණු 01 – 03 | 03වන ඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| හරයාත්මක වටිනාකම් හා උපායමාර්ග සඳහා සක්‍රියකාරක | ඉලක්කය 4 | අරමුණු 01 – 04 | 04වන ඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| | ඉලක්කය 5 | අරමුණු 01 – 02 | 05වන ඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| | ඉලක්කය 6 | අරමුණු 01 – 03 | 06වනඉලක්කය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |

## දැක්ම

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම

## මෙහෙවර

වරප්‍රසාද නොලත් තරුණතරුණියන්ට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

## අපගේ වටිනාකම්

අපගේ ක්‍රියාකරකම් නිම කිරීමට අපේක්ෂා කරනුයේ කුමක් සඳහා සහ කෙසේද යන්න මහපොළ භාර අරමුදලේ හරයාත්මක වටිනාකම් මඟින් පැහැදිලි කෙරේ. තවද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ස්වාධීන අරමුදලක් වශයෙන් පවතින මෙම අරමුදල ආයතනික සංස්කෘතිය තුළ විශිෂ්ටත්වයේ සලකුණක් වශයෙන් පැවතීම ද එමඟින් නිරූපණය වන අතර අපගේ දැක්ම, ඉලක්ක හා ඒ හා සබැඳි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මඟපෙන්වීම ලබා දෙන අනුගම්‍ය ප්‍රතිපත්ති ද එමඟින් සැපයේ.

මහපොල භාර අරමුදලේ හඳුනාගත් හරයාත්මක වටිනාකම් වනුයේ

- **සුපිලිපන්බව**

  මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගැනීමේ දී අප විසින් සාධාරණ ආකාරයෙන් විනිවිදභාවය සමඟින් නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන අතර සුදුසුකම් ලබන සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව මුදල් සාධාරණ කාල පරිච්ඡේදයක් සඳහා ලබා දීමට ද නිරන්තරයෙන් උත්සුක වේ.

- **ධනාත්මක ආකල්ප**

  ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ දී, අනෙකුත් ආයතන හා විශ්වවිද්‍යාල සමඟ කටයුතු කිරීමේ දී හා අරමුදල් සපයා ගැනීමේ දී අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එකී සියලු අභියෝග සඳහා සාර්ථක අයුරින් මුහුණ දීම සඳහා සේවක මණ්ඩලය කැපවී සිටිනු ලැබේ.

- ප්‍රතිඵලදායක බව

ස්වකීය කාර්යභාරය පිළිබඳ ව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සේවක මණ්ඩලය තුළ මනා අවබෝධයක් හා හැඟීමක් පවතින අතර සැලසුම්ගත ඉලක්ක කාර්යක්ෂම අයුරින් සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන් නිරන්තරයෙන් උත්සුක වේ. මාසිකව 7,000ක පමණ වූ ශිෂ්‍යත්වවලට අදාළ ගෙවීම් සිදු කිරීමට කුඩා කාර්ය මණ්ඩලයකට (සේවකයන් 13කට) හැකි වී තිබේ.

- නම්‍යශීලීත්වය

සේවකයින් සහ අධ්‍යක්ෂ ද ඇතුළුව භාරකාර මණ්ඩලය විසින් අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව්‍ය අදහස් සොයා යමින් තරඟකාරී මූල්‍ය වෙළඳ පල තුළ සාර්ථක අයුරින් ඉදිරියට ගමන් කරයි.

- කණ්ඩායම් හැඟීම

ස්වකීය විවෘතභාවය, මිත්‍රශීලීත්වය, පුද්ගල සංවර්ධනය වැනි ගුණාංග සමඟින් මහපොළ භාර අරමුදලේ සේවකයන් ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා සාමූහිකව කටයුතු කරනු ලැබේ.

- විශිෂ්ටත්වය කෙරෙහි නැඹුරුව

මහපොළ භාර අරමුදලේ ඉහළ සේවා තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එහි සේවක මණ්ඩලය කැපවීමෙන් ක්‍රියාකරනු ලැබේ.

## 1 වන ඉලක්කය

"උසස් අධ්‍යාපනය සඳහා පවතින අවස්ථා වැඩි කිරීම හා අඩු වරප්‍රසාදලාභී හා උසස් අධ්‍යාපන අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීමේ වුවමනාව සහිත තරුණතරුණියන් සඳහා මූල්‍ය සහාය ලබා දීම."

## 2 වන ඉලක්කය

"මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අරමුදල වැඩි දියුණු කිරීම සහ දැනට පවතින අරමුදල 2025 වර්ෂය වනවිට දෙගුණ කරලීමෙන් ඉදිරි වසර 10 සඳහා අරමුදල ශක්තිමත් කිරීම."

## 3 වන ඉලක්කය

"ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීමට දායකත්වය ලබා දීම"

## 4 වන ඉලක්කය

"අපොස උසස් පෙළ විභාගයේ දී ඉහළ සාමාර්ථ ලබන මුත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන තරුණතරුණියන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා හා පහසුකම් පුළුල් කිරීම."

## 5 වන ඉලක්කය

"ප්‍රාදේශීය වශයෙන් පවතින ද්විතික පාසැල් වඩාත් ඉහළ තත්ත්වයකට වැඩි දියුණු කිරීම හා ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඔස්සේ අර්ධ-නාගරික වශයෙන් හා ප්‍රාදේශීයව වෙසෙන සිසුන් සඳහා ගුණාත්මක පාසැල් අධ්‍යාපනයක් ලබාදීම හා නාගරික ජනප්‍රිය පාසැල් සඳහා පවතින තරඟකාරිත්වය අඩු කිරීම"

## 6 වන ඉලක්කය

"උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන්ගේ භාෂා කුසලතා දියුණු කිරීම සඳහා සම්පත් හා යටිතල පහසුකම් සැපයීම."

**I වන ඉලක්කය** උසස් අධ්‍යාපනය සඳහා පවතින අවස්ථා වැඩි කිරීම හා අඩු වරප්‍රසාදලාභී හා උසස් අධ්‍යාපන අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීමේ වුවමනාව සහිත තරුණතරුණියන් සඳහා මූල්‍ය සහාය ලබා දීම.

වැඩකරන ජනතාව සඳහා රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ආයතනවල පවතින අධ්‍යාපන අවස්ථා ඉතාමත් සීමකාරී වී තිබේ. එම තරුණතරුණියන් සඳහා මහපොළ භාර අරමුදල මඟින් මූල්‍ය පහසුකම් ලබාදිය හැකි නම්, අධ්‍යාපනික සුදුසුකම් සපුරා ලූ තරුණතරුණියන් ලෙස සමාජයට එක්වීමට ඔවුන්ට හැකියාව ලැබෙන අතර මනා අන්දමින් රටෙහි ආර්ථික කටයුතු සඳහා දායකවීම ද ඔවුන් විසින් සිදු කරනු ඇත.

## I වන ඉලක්කයේ අරමුණු

(1) මහපොළ ශිෂ්‍යත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන සියලුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

(2) දැනට සලකා බැලෙන දෙමාපිය වාර්ෂික ආදායම රු. 500,000/- ක් වන අතර එම සීමාව රු.700,000 දක්වා ඉහළ නැංවීම මඟින් රාජ්‍ය අංශයේ හා ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ පවුල්වල සිසුන් සඳහා ද ශිෂ්‍යත්ව ලබාගැනීමට පහසුකම් සැලසීම.

(3) දැනට ලබා දෙන රු.5,000/- වන ශිෂ්‍යත්ව වාරිකය, 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි රු.7,000/- දක්වා වැඩි කිරීම.

(4) බැංකු ණය කාඩ්පත් ක්‍රමවේදය හරහා සියලුම සිසුන් සඳහා රු.10,000/- සීමාවක් දක්වා වූ මාසික ණය පහසුකමක් හඳුන්වා දීම. මෙම ව්‍යාපෘතිය ලංකා බැංකුව/මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ඇත. මහපොළ ශිෂ්‍යත්ව අරමුදල විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරනු ඇත. ණය සීමාව ස්වයංක්‍රීයව ගලපනු ලැබේ. මහපොළ ශිෂ්‍යත්වලාභීන් නොවන අනෙකුත් ශිෂ්‍යයන්ට ද මෙම ණය පහසුකම සඳහා ඉල්ලුම් කළ හැක.

(5) නවෝත්පාදන සහ පර්යේෂණවල නිරත වී සිටින සිසුන් සඳහා නව ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම.

(6) කැපකරු මාපිය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සහ ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රාහකත්වය ලබාදීමට කැමැත්ත දක්වන රාජ්‍ය/ පුද්ගලික ආයතන සඳහා මෙය විවෘත කිරීම හා ශිෂ්‍යත්වලාභීන් නම් කිරීමට අවස්ථාව ලබා දිය හැකි වීම.

(7) උසස් අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය - ලංකා බැංකුව/ මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් මහපොළ භාරකාර අරමුදල සමඟ එක්වී රුපියල් මිලියනයක් දක්වා වූ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම. මේ සඳහා ණය සහන කාලය වසර 04ක් වන අතර රැකියාවක (දේශීය හෝ විදේශීය) නියුක්ත වීම ආරම්භ කිරීමෙන් පසුව පමණක් ණය ආපසු ගෙවීම ආරම්භ වනු ලැබේ.

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක - I වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 1 | 1.1 | ශිෂ්‍යත්ව පිරිනැමෙන සංඛ්‍යාව වැඩි කිරීම හා සාමාන්‍ය බඳවා ගැනීමේ දී ශිෂ්‍යත්ව නොලැබෙන සිසුන් සඳහා ද ශිෂ්‍යත්ව පිරිනැමීම. | (15,000) 55% | (16.500) 60% | (17,875) 65% | (19,250) 70% | (22,000) 80% | (27,500) 115% |
| | 1.2 | කැපකරු මාපිය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීම, ශිෂ්‍යත්වලාභීන් යෝජනා කරන තැනැත්තන් ඔස්සේ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන තැනැත්තන් රැස්කර ගැනීම. | 2% | 2% | 3% | 3% | 4% | 5% |
| | 1.3 | පුද්ගලික අංශය තුළ තෝරාගත් ක්ෂේත්‍රවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන්ට ශිෂ්‍යත්ව ලබාදීම. | 3% | 3% | 2% | 2% | 6% | 15% |
| | 1.4 | අන්තර්ජාලය හා සබැඳි ගෙවීම් ක්‍රමවේද හඳුන්වා දෙමින් ජාත්‍යන්තර හා දේශීය ප්‍රදානයන් වැඩිකර ගැනීම. | 15% | 50% | 60% | 100% | 100% | 100% |
| | 1.5 | NWCL/NWSLහි ආයෝජනය කර ඇති මහපොළ අරමුදල් ප්‍රතිව්‍යුහගත කිරීම හා ඒවා කල්පිරීමේදී ලැබෙන අතිරේක ආදායම නව ආයෝජන සඳහා යොමු කිරීම | රු. (මිලියන) 200 | රු. (මිලියන) 300 | රු. (මිලියන) 400 | රු. (මිලියන) 500 | රු. (මිලියන) 500 | රු. (මිලියන) 500 |
| | 1.6 | විදේශීය රටකින් අවම පොලී අනුපාතිකයක් යටතේ ණය මුදලක් ලබාගෙන දේශීය මූලාශ්‍රයක එකී ණය මුදල ප්‍රති-ආයෝජනය කිරීම හා එමඟින් අතිරේක ආදායමක් ලබා ගැනීම. මෙසේ ණය ලබා ගැනීමේ දී වසර 4ක ණය සහන කාල සීමාවක් හා නැවත ආපසු ගෙවීමේ කාල සීමාව ලෙස වසර 15ක් ඉල්ලා සිටීම. | රු. (මිලියන) 400 | රු. (මිලියන) 400 | රු. (මිලියන) 400 | රු. (මිලියන) 400 | රු. (මිලියන) 400 | රු. (මිලියන) 400 |
| 2 | 2.1 | සලකා බැලෙන වාර්ෂික කුටුම්භ ආදායම් මටට්ම රු.750,000 දක්වා වැඩිකර රජයේ සේවකයින්ගේ සහ ත්‍රිවිධ හමුදාවල සේවයේ නියුක්තවූවන්ගේ දරුවන් සඳහා ද ශිෂ්‍යත්ව ලබාදීම. | 1000 | 2000 | 2000 | 3000 | 4000 | 5000 |
| 3 | 3.1 | ශිෂ්‍යත්ව වාරිකය රු.7,000/- දක්වා වැඩි කිරීමට අවශ්‍ය කෙරෙන අතිරේක අරමුදල් | රු. (මිලියන) (1100) | රු. (මිලියන) (1220) | රු. (මිලියන) (1320) | රු. (මිලියන) (1400) | රු. (මිලියන) (1500) | රු. (මිලියන) (1500) |
| 4 | 4.1 | සෑම ශිෂ්‍යත්වලාභියෙකු වෙතම පිරිනැමෙන රු.2,000/- අතිරේක ණය මුදලේ පොලිය ගෙවීම මහපොළ භාර අරමුදල විසින් බාර ගැනීම. | රු. (මිලියන) (132) | රු. (මිලියන) (135.6) | රු. (මිලියන) (138.9) | රු. (මිලියන) (164.2) | රු. (මිලියන) (181.5) | රු. (මිලියන) (207.9) |
| 5 | 5.1 | පුද්ගලික අංශය තුළ තෝරාගත් ක්ෂේත්‍රවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන්ට ශිෂ්‍යත්ව ලබාදීම. | 2% | 5% | 10% | 15% | 20% | 25% |

**II වන ඉලක්කය** මහපොළ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අරමුදල වැඩි දියුණු කිරීම සහ දැනට පවතින අරමුදල 2025 වර්ෂය වනවිට දෙගුණ කරලීමෙන් ඉදිරි වසර 10 සඳහා අරමුදල ශක්තිමත් කිරීම.

## II වන ඉලක්කයේ අරමුණු

1. වර්ෂ 2025 දී අරමුදලේ ආයෝජන වත්කම් දෙගුණ කිරීම, එනම් රු. බිලියන 10 සිට රු.බිලියන 20 දක්වා වැඩි කිරීම. අඩු ආදායම්ලාභී තරුණතරුණියන් වෙත පවතින අවස්ථා පුළුල් කිරීම, මෙම වැඩිකිරීම මඟින් අපේක්ෂා කෙරේ.

2. මහපොළ ශිෂ්‍යත්වයක් සඳහා රු. 2,450/-ක් වන භාණ්ඩාගාර දායකත්වය අඩු කරලීම හා අරමුදලේ වාර්ෂික ආදායම වැඩි කරලීම ඔස්සේ සම්පූර්ණ ශිෂ්‍යත්ව වාරික මුදලම (රු.5,000/-) මහපොළ භාර අරමුදල මඟින් ගෙවීම.

3. වර්ෂ 2025 වනවිට දැනට විදේශගත වී සිටින පූර්ව ශිෂ්‍යත්වලාභීන්ගේ සංගම් 03ක් ස්ථාපනය කිරීම.

### ප්‍රධාන කාර්ය සාධන දර්ශක - II වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| | | | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) |
| 1 | 1.1 | අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව ආයෝජන ක්‍රමවේද හඳුනාගැනීම, රජයේ සුරැකුම්පත්වල (100%ක් රජය සතු) ආයෝජනය කිරීම. පිළිගත් පුද්ගලික අංශයේ බැංකුවල 10%ක් ආයෝජනය කිරීම. අපේක්ෂිත අතිරේක ආදායම | 400 | 500 | 600 | 700 | 800 | 1000 |
| | 1.2 | මහපොළ අරමුදල ඔස්සේ නව අන්තර්ජාල ලොතරැයියක් හඳුන්වා දීම. අපේක්ෂිත අතිරේක ආදායම | 500 | 500 | 500 | 750 | 1000 | 1000 |
| | 1.3 | මහපොළ අරමුදල සඳහා මුදල් ප්‍රදානය කරන්නන් ධෛර්යමත් කිරීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම (දේශීය හා විදේශීය). අපේක්ෂිත අතිරේක ආදායම | 200 | 300 | 400 | 500 | 500 | 500 |
| | 1.4 | මහපොළ සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම (ප්‍රාග්ධන වියදම සඳහා ආයෝජනය වශයෙන් කුලී ආදායම සැලකීම). අපේක්ෂිත අතිරේක ආදායම | 200 | 300 | 300 | 300 | 300 | 300 |
| 2 | 2.1 | භාණ්ඩාගාරය විසින් දරනු ලබන රු.2,450/- ශිෂ්‍යත්ව වියදම අඩු කිරීම සඳහා මහපොළ අරමුදල ශක්තිමත් කිරීම සහ එක් සිසුවෙකු වෙනුවෙන් රු.2,000/- අතිරේක ප්‍රතිපාදනයක් ලබා දීම. | (550) | (565) | (590) | (600) | (700) | (800) |
| 3 | 3.1 | එංගලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව වැනි රටවල සංගම් හරහා ප්‍රදානයන් රැස් කිරීම. | 200 | 200 | 300 | 500 | 500 | 500 |

III වන ඉලක්කය  ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සඳහා දායකවීම

## III වන ඉලක්කයේ අරමුණු

1. මහපොළ භාර අරමුදල ඔස්සේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT)මෙහෙයුම් පුළුල් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් සම්පාදනය කිරීම

### ප්‍රධාන කාර්ය සාධන දර්ශක - III වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 1 | 1.1 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ශාඛා සෑම දිස්ත්‍රික්කයක් තුළම ආරම්භ කිරීම. නාගරික හා ගම්බද ප්‍රදේශවල සිසුන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම හා සාධාරණ ගාස්තුවක් යටතේ එම පහසුකම පිරිනැමීම.<br><br>ඉහත ව්‍යාපෘතිය සඳහා පිරිවැය<br><br>පරිගණක සාක්ෂරතාවයේ ඉහළ යෑම | (රු.මිලියන)<br>100<br>5% | (රු.මිලියන)<br>100<br>10% | (රු.මිලියන)<br>200<br>15% | (රු.මිලියන)<br>200<br>20% | (රු.මිලියන)<br>300<br>25% | (රු.මිලියන)<br>300<br>50% |
| | 1.2 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ලාභාංශ වලින් අවශ්‍ය කෙරෙන ප්‍රතිපාදන ලබාගනු ලැබේ. | (රු.මිලියන)<br>100 | රු. (මිලියන)<br>100 | රු. (මිලියන)<br>200 | රු. (මිලියන)<br>200 | රු. (මිලියන)<br>300 | රු. (මිලියන)<br>300 |

IVවන ඉලක්කය  අපොස උසස් පෙළ විභාගයේ දී ඉහළ සාමාර්ථ ලබන මුත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන තරුණතරුණියන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා හා පහසුකම් පුළුල් කිරීම.

## IV වන ඉලක්කයේ අරමුණු

1. විදේශ විශ්වවිද්‍යාලයකට අනුබද්ධිත වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීම
2. භාෂා අධ්‍යයන සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීම
3. රත්මලානේ පිහිටි ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීම හා එහි පහසුකම් වැඩිදියුණු කිරීම
4. අපොස උසස් පෙළ විභාගය සමත්වන සිසුන්ට පුද්ගලික විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීමට හැකිවන සේ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම
5. ශ්‍රී ලංකාවේ සෑම කාර්මික විද්‍යාලයකම ගාස්තු අයකෙරෙන පාඨමාලා ආරම්භ කිරීම හා එමඟින් රැස්වන අතිරේක අරමුදල් එකී ආයතනවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යොදා ගැනීම

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක - IV වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්යසාධන දර්ශකය | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 1 | 1.1 | වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීම සහ සාධාරණ ගාස්තුවක් යටතේ උපාධි පිරිනැමීම. | - | - | රු.මිලියන 100 | රු.මිලියන 200 | රු.මිලියන 200 | රු.මිලියන 200 |
| | 1.2 | එම සිසුන් සඳහා සායනික පුහුණුව ලබා දීම සඳහා දේශීය හා විදේශීය රෝහල්වල සහයෝගය ලබාගැනීම. මෙම අවස්ථාව දේශීය මෙන්ම විදේශීය සිසුන් සඳහා ද විවෘත වන අතර මහපොළ භාර අරමුදල පුද්ගලික ආයතනයක් සමඟ හවුල්වනු ඇත. (රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය)<br>ප්‍රාග්ධන වියදම්වලින් 50%ක් මහපොළ භාර අරමුදල විසින් දරන අතර ඉතිරි 50% වියදම පුද්ගලික ආයතනය විසින් දැරිය යුතු වේ. | රු.මිලියන 200 | රු.මිලියන 300 | රු.මිලියන 300 | රු.මිලියන 400 | රු.මිලියන 200 | රු.මිලියන 500 |
| | 1.3 | මහනුවර හෝ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ මෙම වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. | 5% | 10% | 30% | 50% | 100% | |
| | 1.4 | විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන අතර, Z-score ක්‍රමය හරහා වෛද්‍ය පීඨවලට තෝරා නොගත් සිසුන් මෙහිදී තෝරාගැනීම සිදු වේ.<br>- දේශීය<br>- විදේශීය | -<br>- | -<br>- | 100<br>20 | 200<br>30 | 300<br>50 | 300<br>100 |
| | 1.5 | අවශ්‍යතා සහිත සිසුන් සඳහා ණය පහසුකම් පිරිනැමීම | - | - | රු.මිලියන 50 | රු.මිලියන 100 | රු.මිලියන 150 | රු.මිලියන 200 |
| 2 | 2.1 | විදේශ භාෂා අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීම.<br>වියදම<br>බඳවා ගැනීම | රු.මිලියන<br>100<br>400 | රු.මිලියන<br>300<br>600 | රු.මිලියන<br>200<br>1500 | රු.මිලියන<br>100<br>3000 | රු.මිලියන<br>100<br>4000 | රු.මිලියන<br>100<br>5000 |
| 3 | 3.1 | ගාස්තු අය කෙරෙන පාඨමාලා හඳුන්වා දීම හා එමඟින් අතිරේක ආදායම් උත්පාදනය කිරීම. අඩු ආදායම්ලාභී ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම. | රු.මිලියන<br>10<br>- | රු.මිලියන<br>20<br>- | රු.මිලියන<br>30<br>(20) | රු.මිලියන<br>50<br>(50) | රු.මිලියන<br>100<br>(100) | රු.මිලියන<br>200<br>(100) |
| 4 | 4.1 | රජයේ බැංකු සමඟ එකඟතාවයකින් යුතුව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය සුරැකුම් මහපොළ භාර අරමුදල මඟින් සැපයීම. නැවත ආපසු ගෙවීමේ කාල සීමාව වසර 05කි. | - | - | - | - | - | - |
| 5 | 5.1 | මුදල් අයකර පවත්වන පාඨමාලා මඟින් රැස්වන අරමුදල් භාවිතා කර අවශ්‍යතා සහිත සිසුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම. | - | රු.මිලියන 50 | රු.මිලියන 100 | රු.මිලියන 100 | රු.මිලියන 100 | රු.මිලියන 200 |

V වන ඉලක්කය ප්‍රාදේශීය වශයෙන් පවතින ද්විතික පාසැල් වඩාත් ඉහළ තත්ත්වයකට වැඩි දියුණු කිරීම හා ඒවායේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඔස්සේ අර්ධ-නාගරික වශයෙන් හා ප්‍රාදේශීයව වෙසෙන සිසුන් සඳහා ගුණාත්මක පාසැල් අධ්‍යාපනයක් ලබාදීම හා නාගරික ජනප්‍රිය පාසැල් සඳහා පවතින තරඟකාරිත්වය අඩු කිරීම.

## V වන ඉලක්කයේ අරමුණු

1. සියලුම විශ්වවිද්‍යාල ආවරණය වන ආකාරයෙන් විශ්වවිද්‍යාලවලට අනුබද්ධි ජාතික පාසැල් ආරම්භ කිරීම

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක - V වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 1 | 1.1 | අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය සමඟ මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල හා විශ්වවිද්‍යාල ඔස්සේ මෙම කාර්යය සඳහා යටිතල පහසුකම් සැපයීම. | රු.මිලියන 50 | රු.මිලියන 100 | රු.මිලියන 150 | රු.මිලියන 200 | රු.මිලියන 250 | රු.මිලියන 300 |
| | 1.2 | මෙම සම්බන්ධතාවය යටතේ, පාසැල් සිසුන් සඳහා ඉගැන්වීම සඳහා විශ්වවිද්‍යාල සිසුන් සම්බන්ධ වේ. අවශ්‍ය කෙරෙන විෂය මාලා පාසැල වෙත ලබාදීම හා අමතර පංති සඳහා සිසුන් ඇතුළත් වීම අවම කිරීම. | 5% | 10% | 20% | 30% | 40% | 50% |
| | 1.3 | පාසැල්හි ඉගෙනුම් විෂයමාලා වැඩිදියුණු කිරීම හා නාගරික පාසැල්හි පවතින තදබදය ඉවත් කිරීම හා විශ්වවිද්‍යාල සිසුසිසුවියන් සඳහා නායකත්ව කුසලතා හා අන්තර් පුද්ගල සම්බන්ධතා සඳහා අවශ්‍ය කුසලතා වැඩිදියුණු කරගැනීමට අවස්ථාව ලබා දීම. | 10% | 20% | 30% | 40% | 50% | 60% |

VI වන ඉලක්කය උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන්ගේ භාෂා කුසලතා දියුණු කිරීම සඳහා සම්පත් හා යටිතල පහසුකම් සැපයීම.

## VI වන ඉලක්කයේ අරමුණු

1. ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඉංග්‍රීසි ඉගෙනුම් ඒකක ස්ථාපනය කිරීම

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක - VI වන ඉලක්කයේ අරමුණු

| අරමුණ | | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| 1 | 1.1 | ඉංග්‍රීසි භාෂා දැනුම වැඩිදියුණු කරගැනීම සඳහා අවැසි යටිතල පහසුකම් ලබා දීම | 10% | 20% | 20% | 30% | 40% | 50% |
| | 1.2 | ඒ අනුව, ගුරුවරුන් හා උපකරණ සඳහා වැයවන අතිරේක පිරිවැය මහපොළ භාර අරමුදල මඟින් දරන අතර පිරිවැයෙන් කොටසක් පමණක් ආපසු අයකර ගැනේ. | රු.මිලියන 20 | රු.මිලියන 30 | රු.මිලියන 50 | රු.මිලියන 50 | රු.මිලියන 100 | රු.මිලියන 100 |
| | 1.3 | විශේෂ ඉංග්‍රීසි පාඨමාලා හඳුන්වා දීම සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ විශේෂයෙන් උසස් පෙළ සමත් වූවන් සඳහා අවම වශයෙන් මාස 06ක පුහුණුවක් ලබා දීම | 5% | 10% | 15% | 20% | 30% | 40% |

අපේක්ෂිත මුදල් ප්‍රවාහ විශ්ලේෂණය

| | | 2020<br>රු.මිලියන | 2021<br>රු.මිලියන | 2022<br>රු.මිලියන | 2023<br>රු.මිලියන | 2024<br>රු.මිලියන | 2025<br>රු.මිලියන |
|---|---|---|---|---|---|---|---|
| අපේක්ෂිත ආදායම | 1වන ඉලක්කය | 600 | 700 | 800 | 900 | 900 | 900 |
| | 2වන ඉලක්කය | 1500 | 1800 | 2400 | 3250 | 3600 | 3700 |
| | 3වන ඉලක්කය | 100 | 100 | 200 | 200 | 300 | 300 |
| | 4වන ඉලක්කය | 10 | 20 | 30 | 50 | 100 | 200 |
| | 5වන ඉලක්කය | - | - | - | - | - | - |
| | 6වන ඉලක්කය | - | - | - | - | - | - |
| | | **2210** | **2620** | **3430** | **4400** | **4900** | **5100** |
| | | | | | | | |
| අපේක්ෂිත වියදම | 1වන ඉලක්කය | (1132) | (1355.6) | (1458.9) | (1538.9) | (1681.8) | (1707.9) |
| | 2වන ඉලක්කය | (550) | (565) | (590) | (600) | (700) | (800) |
| | 3වන ඉලක්කය | (100) | (100) | (200) | (200) | (300) | (300) |
| | 4වන ඉලක්කය | (250) | (350) | (400) | (500) | (300) | (600) |
| | 5වන ඉලක්කය | (50) | (100) | (150) | (200) | (250) | (300) |
| | 6වන ඉලක්කය | (20) | (30) | (50) | (50) | (100) | (100) |
| | | **(2102)** | **(2500.6)** | **(2848.9)** | **(3088.9)** | **(3331.8)** | **(3807.9)** |
| | | | | | | | |
| අතිරික්තය | | **108** | **119.4** | **581.1** | **1311.1** | **1568.2** | **1292.1** |

උපායමාර්ග සඳහා සක්‍රියකාරක

මනාව ස්ථාපනය කරනු ලැබූ ආයතනය විසින් සිය උපායමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඔස්සේ ස්වකීය ඉලක්ක සාක්ෂාත් කරගෙන ඇත. මෙම ක්‍රියාවලියට උපායමාර්ග සඳහා සක්‍රියකාරක මඟින් මනා පිටිවහලක් ලැබී ඇති අතර ඵලදායි උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ද අඩිතාලමක් සැපයී තිබේ.

මහපොළ භාර අරමුදලේ සංදර්භය සැලකූ විට, ඉලක්ක හා අරමුණු ආවරණය වන එහි උපායමාර්ග ප්‍රධාන සක්‍රියාකාරක ත්‍රිත්වයක් ඔස්සේ දිවෙනු ලැබේ. එනම්;

1. ශක්තිමත් ආයතනික ව්‍යුහය - භාරකාර මණ්ඩලය සැලකූවිට එහි සාමාජිකත්වය සඳහා නිලබලයෙන් පත් වෙනුයේ රජයේ ආයතනවල ඉහළ තනතුරු දරන නිලධාරීන් වේ. මෙය ආයතනයේ සාධනීය සංස්කෘතියක් නිර්මාණය සඳහා උපකාරී වේ.
2. නව තාක්ෂණය උපයෝගී කරගැනීම, කාර්යක්ෂම ක්‍රමවේද හා යටිතල පහසුකම් පැවතීම
3. කාර්ය මණ්ඩලයේ කැපවීම හා කාර්යවල නියුක්තවීම. 13කින් සමන්විත කුඩා කාර්ය මණ්ඩලයක් සතු වුවද, මහපොළ භාර අරමුදල විසින් එක් ලිත් මාසයක් තුළ 70,000කට අධික ශිෂ්‍යත්ව ගෙවීම් වලට අදාළ කටයුතු හා අනෙකුත් සම්බන්ධිත කටයුතු ඉටු කරනු ලැබේ.

**සමාප්තිය**

මෙම ලේඛනය මඟින් මහපොළ භාර අරමුදලේ ඉදිරි පස් වසර සඳහා වන උපායමාර්ගික සැලැස්ම ඉදිරිපත් කෙරේ. එමඟින් උපායමාර්ගික කාර්ය සැලසුමක් ඉදිරිපත් කෙරන අතර ශ්‍රී ලංකාවේ උගත් සමාජයක් බිහිකරලීම උදෙසා සහ රටෙහි සංවර්ධනය සඳහා සහභාගීවිය හැකි සිය උසස් අධ්‍යාපන අවශ්‍යතාවය වෙනුවෙන් වෙර දරන අඩු පහසුකම්ලාභී තරුණතරුණියන් සඳහා මූල්‍ය සහයෝගය සැපයීමට උත්සාහ දරන මහපොළ භාර අරමුදලේ කාර්ය මණ්ඩලය හා භාරකාර මණ්ඩලයේ ස්වභාවය නිරූපණය වේ. අපගේ දරුවන්/සිසුසිසුවියන් සේම අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ට අපගේ වටිනා ප්‍රයත්නය සඳහා සිය සහයෝගය ලබා දීම සඳහා ප්‍රමාණවත් අනුප්‍රාණයක් අපගේ අභිප්‍රාය හා අභිලාෂ තුළින් එක්වෙන බවට අපි විශ්වාස කරන්නෙමු. අපගේ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය නිර්ණය වනුයේ අපගේ කැපවීම මත වේ. අප විසින් වගකිව යුතු හා වගවිය යුතු උපායමාර්ග දියත් කිරීමේ ක්‍රියාවලිය තුළ අප එක් කණ්ඩායමක් වශයෙන් එක්වී සිටින්නෙමු.

මෙම උපායමාර්ගික සැලැස්ම නිශ්චිත කාලවකවානු තුළ දී සමාලෝචනය කරන අතර, ගතික තත්ත්ව අභිමුව එහි අදාළත්වය පවත්වාගැනීම සඳහා අවශ්‍ය කරන ගැලපුම් හෝ වෙනස් කිරීම් සිදුකරනු ලැබේ. වඩාත් යහපත් ලොවක් බිහිකරලීම සඳහා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ කාර්යයේ දී වඩාත් ශක්තිමත්ව සිටීම සඳහා අප විසින් උපාය මාර්ග සැකසීමේ ක්‍රියාවලිය තුළ දියත් කරන අභ්‍යන්තර සාකච්ඡා, විවේචනාත්මක ස්වයං සමාලෝචන හා සවිස්තරාත්මක විශ්ලේෂණ උපකාරී වන බවට අප විසින් විශ්වාස කරන අතර එය තහවුරු වී ද තිබේ.

**එම්.පී.බණ්ඩාර**
**අධ්‍යක්ෂ**
**මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල**